# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

සමාජීය විද්‍යා පීඨය

## සංචරණය සහ සංස්කෘතික සම්පත් කළමනාකරණය

## සංචරණයේ ඉතිහාසය - TCRM 18224

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ක්‍රි. පූ. 03 වන සියවසේ සිට 20 වන සියවස දක්වා ලෝක සංචාරක ඉතිහාසය තුළ වැදගත් සංධිස්ථාන කවරේදැයි කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20)

02. 19 වන සියවසේ සංචාරක කර්මාන්තයේ වර්ධනයට හේතු වූ කරුණු විමසන්න. (ලකුණු 20)

03. "ශ්‍රී ලංකාවේ සංචරණ ඉතිහාසය හැදෑරීමේ දී 19 වන සියවසට පෙර මෙරටට පැමිණි විදේශීය ජාතිකයන් විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු මූලාශ්‍ර වැදගත් වේ." ඉහත ප්‍රකාශය යෝග්‍ය මූලාශ්‍ර ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

04. 19 වන ශතවර්ෂයේ මැද භාගයේ සිට මේ දක්වා ශ්‍රී ලාංකේය සංචාරක ඉතිහාසය තුළ වූ වැදගත් සංධිස්ථාන කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. ලෝක සංචාරක ඉතිහාසය තුළ ඊජිප්තු, ග්‍රීක සහ රෝම යන යුගයන් හී කැපී පෙනෙන ලක්ෂණ වෙන් වෙන්ව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. අ) 17 වන සියවස තුළ ලොවට හඳුන්වා දුන් 'මහා චාරිකාව' (Grand Tour) යන සංකල්පය එහි සුවිශේෂී ලක්ෂණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

    ආ) 'මහා සංචාරණය' (Mass Tourism) යන සංකල්පය ලොවට හඳුන්වා දීම උදෙසා තෝමස් කුක්ගේ දායකත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

07. අ) ලෝක සංචාරක ඉතිහාසය තුළ මධ්‍යතන යුගයේ (ක්‍රි.ව. 500-1400) සංචාරක කටයුතුවල ස්වභාවය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 10)

    ආ) ලෝක සංචාරක ඉතිහාසය තුළ ජල සම්බාහන නිකේතන (Spa Resorts) සහ වෙරළ නිකේතන (Beach Resorts) විශේෂයෙන්ම ක්‍රි.ව. 17-18 වන සියවස්හි සංචාරක කර්මාන්තයට දැක්වූ දායකත්වය පිළිබඳ විමසන්න. (ලකුණු 10)

08. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක් (02)</u> පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සපයන්න.

    අ) චීනයේ සංචාරක කර්මාන්තයේ ඉතිහාසය සහ වර්තමාන තත්ත්වය
    ආ) ඉන්දියාවේ සංචාරක කර්මාන්තයේ ඉතිහාසය සහ වර්තමාන තත්ත්වය
    ඇ) මාලදිවයිනෙහි සංචාරක කර්මාන්තයේ ඉතිහාසය සහ වර්තමාන තත්ත්වය

(ලකුණු 2x10 = 20)

*************************************